# උතුරු පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලාධිපති සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරඟ විභාග – 2017 (II)

උතුරු පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලාධිපති සේවයේ III වැනි ශ්‍රේණියේ පවතින පුරප්පාඩු 30ක් සඳහා බඳවා ගැනීමේවිවෘත හා සීමිතතරග විභාගය උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් **2017 දෙසැම්බර් මාස** යාපනයේදී පවත්වන බව දන්වා සිටිනු ලැබේ.අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **30.11.2017**වේ.

**02බඳවා ගැනීමේ සේවා කොන්දේසි:-**

02.1 2013.01.01 වැනි දින සිට බල පැවැත්වෙන පරිදි උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද පුස්තකාලාධිපති සේවයේ සේවා ව්‍යවස්ථාවේ අනුමත කරන ලද කොන්දේසි සහ බඳවා ගැනීමේ ව්‍යවස්ථාවේ විධිවිධාන යනාදිය හා ඒවායෙහි කලින් කලට සිදු කරනු ලබන වෙනස් කිරීම් වලටත්, ආයතන සංග්‍රහය,මුදල් රෙගුලාසි සහ ශ්‍රී ලංකා සමාජවාදි ජන රජයේ අංක 1817/30 සහ2013.07.03 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද උතුරු පළාත් රාජ්‍ය සේවයේ ආයතන සංග්‍රහය යනාදියට අනුකූලව තෝරා ගන්නා ලද අයදුම් කරුවන් එම තනතුරේ 111 වැනිශ්‍රේණියට පත් කරනු ලැබේ.

02.2 මෙම විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් පත්වීම් දිනයේ සිට වසර 03 පරිවාස කාලයකට යටතේ111 වැනි ශ්‍රේණිතනතුරට පත් කරනු ලැබේ. මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පුස්තකාලාධිපති සේවයේ III වනි ශ්‍රේණියට බඳවා ගන්නා ලද දිනයේ සිට වසර 03 ක කාලයක් ඇතුලත පළමුවැනි කාර්යක්ෂමතා කඩයිම් විභාගයෙන් සමත්විය යුතුය.

02.3 මෙම සේවය ස්ථානමාරු සහිත සේවයකි. එබැවින් මෙම පත්වීම් ලබන අය උතුරු පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළයුතු බවට වූ කොන්දේසියට යටත්විය යුතුය.

02.4 එක් සේවා ස්ථානයක පත්වීම් ලබන්නෙකු එකී සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 05 ක් අඛණ්ඩව සේවය කළයුතු බවට අනිවාර්ය වූ කොන්දේසියකි.

02.5 රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 01/2014සහ මේ සම්බන්ධයෙන් යථා කාලයේ දි නිකුත් කරණු ලබන චක්‍ර ලේඛ වලට අනුව පත්වීමේ දිනයේ සිට වසර 05 ක් අවසන්වීමට පෙර එහි සඳහන් දෙවැනි රාජ්‍ය භාෂාවකින් සමත්විය යුතුය.

02.6පත්වීම් සංඛ්‍යාව සහ ක්‍රියාත්මක කරණු ලබන දිනය යනාදිය පත්වීම් බලධාරියා විසින් තීරණය කරණු ලැබේ. ඇතැම් පුරප්පාඩු හෝ සම්පූර්ණ පුරප්පාඩු සම්පූර්ණ නොකර සිටීමට පත්වීම් බලධාරියාට බලය ඇත. පත්කරනු ලබන නිලධාරි සංඛ්‍යාව 30 වේ.

**03වැටුප් පරිමාණය:-**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි වැටුප් කේත අංක **MN-3-2016**අනුව බඳවා ගනු ලබන පුස්තකාලාධිපති සේවයේ III ශ්‍රේණියට,අදාල වන මාසික වැටුප් පරිමාණයරු: **31,040/= - 10x445 - 11x660 - 10x730- 10x750 - 57,550/=**වේ. (රු. 31,930/= වැටුප් පියවරට පැමිණීමට පෙර කාර්යක්‍ෂමතා කඩඉමකින් සමත් විය යුතුය.) එහෙත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

**04සාමාන්‍ය සුදුසුකම්:-**

04.1 අයදුම්කරු ශ්‍රී ලංකාවෙ පුරවැසියෙකු විය යුතුය.

04.2 උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. එනම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වර්ෂ 06ක කාලයෙන් අඩුම වශයෙන් වර්ෂ 03ක් වත් උතුරු පළාත තුළ ස්ථිරව හා නොකඩවා පදිංචිය ඇති අයෙකු විය යුතුය.

**හෝ**

අයදුම්කරු හෝ දෙමාපියන් උතුරු පළාතේ උපන් අය විය යුතු අතර අවම වශයෙන් අවුරුදු 05ක් උතුරු පළාතේ නොකඩවා පදිංචිව සිටිය යුතුය.(සම්මුඛ පරීක්ෂණයේදී ස්ථිර පදිංචි තහවුරු කිරීම සඳහා ඡන්ද හිමි නාම ලේඛනයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය)

04.3 අයදුම්කරු උතුරු පළාතේ කුමන හෝ ප්‍රදේශයක සේවය කිරීමට හැකි පරිදි මනා ශරීර සෞඛ්‍යකින් හා හොඳ චරිතවත් පුද්ගලයෙක් විය යුතුය.

04.4 මෙම අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ ඊට පෙරුම් ඉල්ලුම් කරන ලද සියලුම සුදුසුකම් ලබා තිබිය යුතුයි.

04.5 අයදුම්කරුවන් අයඳුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු **18 ට නොඅඩු හා අවුරුදු 35ට** නොවැඩි වියු යුතුය.

**05 අධ්‍යාපන සුදුසුකම්:-**

**05.01පුස්තකාලාධිපති සේවයේ III වන ශ්‍රේණියට විවෘත තරඟ විභාගය මගින් බඳවා ගැනීම**

(අ) (i)අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි යන භාෂා 3න එක් විසයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය.

**සහ**

(ii)ගණිතය සහ වෙනත් විෂයයන් 2කට සම්මාන සමාර්ථ සහිතව විෂයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් විය යුතුය. (මින් විෂයන් 5ක් එකවර සමත් වී තිබිය යුතුය)

ඊට අමතරව අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය ඕනෑම විෂයන් 3කින් සමත් විය තිබීම.

**සහ**

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමාව සමත්ව තිබීම.

**හෝ**

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමාව සමත්ව තිබීම.

**05.02පුස්තකාලාධිපති සේවයේ III වන ශ්‍රේණියට සීමිත තරඟ විභාගය මගින් බඳවා ගැනීම**

(අ) (i)පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සේවයේ පුස්තකාල සහායක/ පුස්තකාල සේවක තනතුරේ ස්ථිර කර තිබීමසහ එම තනතුරෙහි වසර 10ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම සහ අයඳුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 5ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.(මේ සඳහා උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**සහ**

(ආ) (i) පිළිගත් විශ්ව විද්‍යාලයකින් පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමාව පළමු වසර සමත්ව තිබීම.

**හෝ**

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමාව පළමු වසර සමත්ව තිබීම.

**06 බඳවාගැනීමේ ක්‍රමය:-**

06.1 ලිඛිත පරීක්ෂණයක් පදනම් කරගෙන බඳවා ගන්නා අවස්ථාවේ දි බලපැවැත්වෙන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ, බඳවා ගැනිමේ පරිපාටිය ජාතික සහ පළාත් ප්‍රතිපත්ති යනාදියට අනුව බඳවා ගනුලැබේ.මෙම දැන්වීම මගින් ඉල්ලා සිටින සුදුසුකම් සියල්ලම සම්මුඛ පරීක්ෂණයේ දි පරීක්ෂා කරණු ලැබේ.අවශ්‍යවන සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් මෙම තනතුර සඳහා වු හිමිකම් අවලංගු කරණු ලැබේ.සම්මුඛ පරීක්ෂණයේ දි සියලු සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.ඒ සඳහා අමතර ලකුණු කිසිවක් ලබාදෙනු නොලැබේ.

06.2 ඉහත සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් ලිඛිත පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන්ගෙන් ඔවුන් ලැබු මුලු ලකුණුවල අනුපිලවෙල අනුව පවතින පුරප්පාඩුවලට පත්වීම් ලබාදීම සඳහා තෝරාගනු ලැබේ.

06.3 පවතින පුරපුපාඩු වලින් 30%ක් සීමිත තරඟ විභාගය මගින් පුරවනු ලැබේ.

06.4 පුරප්පාඩු වලින් 3% ක් ආබාධිත පුද්ගලයන් සඳහා (ආබාධිත තත්වය)වෙන් කර ඇත. පත්වීම් සඳහා තෝරා ගැනිමේදි ආබාධිත පුද්ගලයන් රාජකාරි කිරිමට එම ආබාධිත තත්වය රාජකාරියට බාධාවක් නොවන බව විශේෂ වෛද්‍ය පරීක්ෂණයක් මගින් සනාථ කළ යුතු ය.

**07 විභාග ගාස්තු :-**

අයදුම්කරු පදිංචිව සිටින උතුරු පළාතේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රු.500/= ක් මුදලක් උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක **3401** දරණ තැන්පත් ගිණුමට ගෙවීම් කරන ලද මුදල් කුවිතාන්සිය අයදුම්පතෙහි අදාළ කොටුවෙහි නොගැළවෙන පරිදි අලවා ඉදිරිපත් කළ යුතුය. කුමන කරුණක් මත හෝ මෙම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ. මෙම ගාස්තුව වෙනත් විභාග සඳහා මාරු කිරීමට අනුමත කරනු නොලැබේ.

**08 ඉල්ලුම් කරන ක්‍රමය:-**

08.1 මෙම දැන්වීම අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයේ (සෙමී 21 x සෙමී 29) ප්‍රමාණයේ කොළයක 01 සිට 11.1 දක්වා වූ කොටස් පළමුවැනි පිටුවේත්, ඉතිරි ඒවා අනෙක් පිටුවේත් ඇතුලත්වන පරිදි අයදුම් පත්‍රය පිළියෙළ කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2017.11.30** වැනි දිනට හෝ ඊට පෙර ලැබීමට හැකිවන පරිදි **ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත අංක 393/48, කෝවිල් පාර, යාපනය** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

08.2 ඉල්ලුම්පත්‍රයේ අංක 01 යටතේ නම සඳහන් කිරීමේදී සම්පූර්ණ නමෙහි අගට යෙදෙන නම ඉදිරියට යොදා නමෙහි අනෙකුත් අකුරු නමෙහි පිටුපසින් සඳහන් කළ යුතුය.
උදාහරණ -: SIVAKUMAR K.S.

08.3 එවනු ලබන ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ **"උතුරු පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලාධිපති III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත හා සීමිත තරඟ විභාග – 2017(II)"** යනුවෙන් සඳහන් කළ යුතුය.

08.4 මෙම තරඟ විභාග දෙකටම ඉල්ලුම් කරන අයඳුම් කරුවන් මෙම තරඟ විභාග වලට වෙන වෙනම ඉල්ලුම්පත්‍ර යොමු කළ යුතුවේ. විභාග ගාස්තු වෙන වෙනම ගෙවිය යුතුය.

08.5 අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් තමාවෙත තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් සහ පූර්ව පිටපත් යනාදිය භාරගණු නොලැබේ. විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් එවනු ලැබේ.විභාගය සඳහා ප්‍රවේශ පත්‍රය එවනු ලැබීම අයදුම්කරු සියලු සුදුසුකම් සපුරා ඇති බව අදහස් නොකෙරේ.

08.6 අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03 ට වත් කලින් ප්‍රවේශ පත්‍රය නොලැබී ඇත්නම් ඒ බව පහත සඳහන් විස්තර සහිතව **ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, උතුරු පළාත, අංක 393/48, කෝවිල් පාර, යාපනය** යන ලිපිනයට දැන්විය යුතුය. (දුරකතන අංකය 021- 221 9939, ෆැක්ස්අංකය 021- 221 9940)

**සටහන:**

ඉල්ලීමේ ලිපිය, විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම් පත් අංකය, අයදුම්කරුගේ තැපැල්ලිපිනය, අයදුම් පත්‍රයේ පිටපතක්, අයදුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් යවන ලද තැපැල් කාර්යාලය, ලියා පදිංචි අංකය සහ දිනය, විභාග ගාස්තු ගෙවූ සහතික කරන ලද ඡායා පිටපත , ප්‍රවේශ පත්‍රය යැවිය යුතු ෆැක්ස් අංකය.

**09 පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම:-**

අයදුම්කරුවන් තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම විභාග ශාලාධිපතිට සෑහීමකට පත්විය හැකි අයුරින් තම අනන්‍යතාවය තහවුරු කරනමෙන් ඉල්ලා සිටිනු ලැබේ.පුද්ගල අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලේඛන වලින් කුමණ හෝ එකක් පිළිගණු ලැබේ.

(1) පුද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුණුම් පත .
(11) වළංගුවිදේශ ගමන් බලපත්‍රයක්. (Passport)

ඉහත සඳහන් ලියකියවිලි වලින් එකක් හෝ ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අයදුම් කරුවෙකුගේ හිමිකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් ගේ අභිමතය පරිදි අවලංගුකළ හැකිය. විභාගය පැවැත්වීම පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීති රීතිවලට අයදුම්කරුවන් අවනතවිය යුතුය. එකී නීති රීතිවලට පටහැනිව කටයුතු කළහොත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන දඬුවමකට යටත්විය යුතුය.

**10 අසත්‍ය තොරතුරු සඳහා දඬුවම්:-**

අයදුම්පත්‍ර පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිවැරදි තොරතුරු සැපයිය යුතුයි.මෙම විභාග කොන්දේශියට අනුව යම්කිසි අපේක්ෂයන් විභාගයට පෙර, විභාගයේදී හෝ විභාගයට පසුව කුමන අවස්ථාවක සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත්,එයාගේ විභාගය අයිතිවාසකම් එම අවස්ථාවේදී අවලංගු කරනු ලැබේ.අයදුම්කරු සපයන ලද තොරතුරු කිසිවක් අසත්‍ය බව අනාවරණය වුවහොත්, කුමන අවස්ථාවක හෝ පළාත් රාජ්‍ය සේවයෙන් ඉවත් කල හැක.

**11 විභාග පරිපාටිය:-**

මෙම විභාගය පහත දැක්වෙන ප්‍රශ්න පත්‍ර තුනකින් යුක්ත වේ. මෙම පරීක්ෂණය සිංහල හා දෙමළ යන භාෂා දෙකින් පවත්වනු ලැබේ. අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරිමට ඉඩ දෙනු නොලැබේ.

11.01**පුස්තකාලාධිපති සේවයේ III වන ශ්‍රේණියට විවෘත තරඟ විභාගය මගින් බඳවා ගැනීම**

| අංක | ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල විද්‍යාව | පැය 03යි | 100 යි | 40 යි |
| 02 | බුද්ධි පරීක්ෂණය | පැය 01 යි | 100 යි | 40 යි |
| 03 | සාමාන්‍ය දනුම | පැය 01 යි | 100 යි | 40 යි |

**11.1.1විෂය නිර්දේශය**

**01. පුස්තකාල විද්‍යාව**

**(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය**

**(අ)**පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය, පුරාතන හා සහ නූතන ලෝකයේ ප්‍රධාන පුස්තකාල.

**(ආ)**ලේඛන කලාවේ සහ පොත් ඇතුළු ලේඛන මාධ්‍යයන්හි ආරම්භය හා විකාශනය.

**(ඇ)**මුද්‍රණ ශිල්පයේ ආරම්භය, ව්‍යාප්තිය සහ පුස්තකාල හා සමාජ සංවර්ධන විෂය කෙරෙහි බලපෑම්.

**(ඈ)**පුස්තකාල වර්ග

i. විශේෂ පුස්තකාල
   රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා ආදී ආයතන ආශ්‍රිත පුස්තකාල, පර්යේෂණ පුස්තකාල වල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්

ii. ශාස්ත්‍රීය පුස්තකාල
   විශ්ව විද්‍යාල හා වෙනත් උසස් අධ්‍යාපන ආයතන ආශ්‍රිත පුස්තකාලවල ව්‍යුහය, කාර්යභාරය හා සේවාවන්

iii. පාසැල් පුස්තකාල

iv. මහජන පුස්තකාල

v. පිරිවෙන් පුස්තකාල හා ආරාමික/ ආගමික ආයතන පුස්තකාල

**(ඉ)**පුස්තකාල කමිටු - ව්‍යුහය, අවශ්‍යතාව, වැදගත්කම හා කාර්ය භාරය

**(ඊ)**පුස්තකාල වෘත්තියට අදාළ විද්වත් වෘත්තීය සංවිධාන හා ඒවායේ කාර්ය භාරය : ජාතික හා ජාත්‍යන්තර (ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමෙරිකාව, බ්‍රිතාන්‍ය)

**(උ)**පුස්තකාල ගොඩනැගිලි - සැලසුම්කරණය, සලකා බැලිය යුතු කරුණු
පවත්නා ගොඩනැගිල්ලක පුස්තකාලයක් ස්ථාපනය, සංවිධානය හෝ වැඩිදියුණු කිරීම

**(ඌ)**පුස්තකාල ද්‍රව්‍ය නඩත්තුව, සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)

**(එ)**ආපදා (Disaster) සහ ආපදා කළමනාකරණය (Disaster Management)

**02. දැනුම සහ තොරතුරු සංවිධානය**

**(අ)**ග්‍රන්ථ වර්ගීකරනයේ අරමුණු සහ ප්‍රයෝජන.

**(ආ)**ශ්‍රී ලංකාවේ පුස්තකාලයන්හි භාවිතා වන ප්‍රධාන වර්ගීකරණ ක්‍රම : ඩිවි දශම වර්ගීකරණය, විශ්ව දශම වර්ගීකරණය.

(ඇ)පුස්තකාල සූචියේ අරමුණු, ඇංග්ලෝ ඇමෙරිකානු සූචිකරණ නීති සංග්‍රහ (AACR) සම්ප්‍රදාය
(ඈ)ග්‍රන්ථ විස්තරය
(ඉ)AACR 2 සංස්කරනය භාවිතා කරමින් සංලේඛ සම්පාදනය

**03. පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා**
(අ)විවිධ පුස්තකාල සම්පත්.
(ආ)එකතු සංවර්ධනය, එකතු සංවර්ධන ප්‍රතිපත්ති හා එහි වැදගත් කම.
(ඇ)පුස්තකාල සම්පත් තේරීම ඇතුළු ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය
i. පුස්තකාල සම්පත් තේරීමේ මූලධර්ම
ii. ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය, පිරිසැකසුම්කරණය ඇතුළු විවිධ තාක්ෂණික සේවා
iii. තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය
(ඈ)ප්‍රකාශනය, ප්‍රකාශන හිමිකම හා වාරණය
(ඉ)ප්‍රවර්තන සම්ප්‍රජානන සේවය (Current Awareness Service)
(ඊ)පාඨක අධ්‍යාපන වැඩසටහන්
(උ)මහජන සම්බන්ධතා සහ පුස්තකාල ප්‍රචාරණය

**04. තොරතුරු සන්නිවේදන තාක්ෂණය**

පුස්තකාල වල පරිගණක භාවිතය හා පුස්තකාල සේවාවන් හා කාර්යයන් වලදී තොරතුරු තාක්ෂණයේ වැදගත්කම හා ඵලදායීතාව

**බුද්ධි පරීක්ෂණය**
පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයින් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරනය හා කාලය හා අවකාශය අතර සහසම්න්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

**සාමානය දැනීම**
ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අද්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද පුස්තකාල විෂය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමානය දැනුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත් භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

**11.2 පුස්තකාලාධිපති සේවයේ III වන ශ්‍රේණියට සීමිත තරඟ විභාගය මගින් බඳවා ගැනීම**

| අංක | ප්‍රශ්න පත්‍රය | කාලය | ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01 | පුස්තකාල විද්‍යාව | පැය 03යි | 100 යි | 40 යි |
| 02 | බුද්ධි පරීක්ෂණය | පැය 01 යි | 100 යි | 40 යි |
| 03 | සාමාන්‍ය දනුම | පැය 01 යි | 100 යි | 40ි |

**11.2.1 විෂය නිර්දේශය**

**01. පුස්තකාල විද්‍යාව**
(1) **පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය**
(අ)පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය.
(ආ)පුස්තකාලයන්හි සාමාජික කාර්ය භාරය.
(ඇ)පොත් සහ විවිධ ලේඛන හා ලේඛන, මුද්‍රිත නොවන මාධයයන්හි ආරම්භය හා විකාශනය.

(ඈ)විද්වත් වෘත්තීය සංගම්
i. ශ්‍රී ලංකා පුස්තකාල සංගමය
ii. ඇමෙරිකානු සහ බ්‍රිතාන්‍ය පුස්තකාල සංගමය
(ඉ)පුස්තකාල වර්ග
i. පාසැල් හා විද්‍යායතන පුස්තකාල
ii. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු පුස්තකාල
iii. මහජන පුස්තකාල

(ඊ)පුස්තකාල කමිටු
(උ)සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)

**02. දැනුම සහ තොරතුරු සංවිධානය**
(අ)ග්‍රන්ථ වර්ගීකරණයේ අරමුණු සහ ප්‍රයෝජන.
(ආ)ග්‍රන්ථ වර්ගීකරණයේ මූලිකාංග.
(ඇ)දශම වර්ගීකරණය
(ඈ)සූචිකරණය, එහි අරමුණු
(ඉ)AACRසූචිකරණය නීති සංග්‍රහය
(ඊ)සංඛ්‍යා ලේඛන හා ග්‍රන්ථ විස්තරය
(උ)සූචි වර්ග

**03. පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා**
(අ)විවිධ පුස්තකාල සම්පත්.
(ආ)පුස්තකාල සම්පත් තේරීම හා තේරීමේ ක්‍රියාවලිය.
(ඇප්‍රතිග්‍රහණය හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය
(ඈ)පිරිසැකසුම්කරණය
(ඉ)තොග සමීක්ෂණය හා සහ අපහරණ ක්‍රියාවලිය

**04. තොරතුරු සන්නිවේදන තාක්ෂණය**

පුස්තකාල සේවාවන් කෙරෙහි පරිගණකතාක්ෂණයේ බලපෑම්

**බුද්ධි පරීක්ෂණය**
පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයින් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණිකරනය හා කාලය හා අවකාශය අතර සහසම්න්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ.

**සාමාන්‍ය දැනීම**
ජාතික, කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම අප සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අද්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද පුස්තකාල විෂය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව අපේක්ෂකයාගේ දැනුවත් භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ.

**සටහන :** මෙම විභාගය තරග විභාගයක් වුවත් එයින් පත්වීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයන් සඳහා වෙන් කර ඇති ලකුනු වලින් අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතුය. ලබා ගත් මුළු ලකුණු පදනම් කරගෙන ලකුණු අනු පිළිවෙළට (Merit Order) පත්වීම් ලබාදෙනු ලැබේ.

12 **විභාග ප්‍රතිඵල :-**
අපේක්ෂකයන් ගේ විභාග ප්‍රතිඵල උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.np.gov.lk වෙබ් අඩවියෙහි පළ කරන අතර පසුවඋතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් තැපැල් මගින් නිකුත් කරනු ලැබේ.

**13** මෙම විභාගය පැවැත්වීම හා අවලංගු කිරීමේ බලය **"උතුරු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්"** සතු වේ. ඒ සමගම දෙමළ හෝ සිංහල භාෂාවෙ යම් කිසි වෙනසක් ඇතොත්, දෙමළ භාෂාවෙක් සඳහන් නිවේදනය නිවැරදි බව සැළකියයුතුවෙ.

**සි.ඒ.මෝහන්රාස්**
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු පළාත.